

# රංගන ප්‍රතිභාවෙන් ප්‍රභාමත් භාරත සිනමාවේදිනිය කාජල්

පරපුරක රංගන උරුමය දෝතට ගෙන කාජල් ඉපදුනේ 1975 අගෝස්තු 05 වැනි දිනයි. මේ වන විට ඇය තිස් හතර හැවිරිදිය. මුම්බායි හී, මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ උපන් ඇයට ටනීෂා නම් එක් සොහොයුරියක් සිටින අතර, ඇය ද මේ වන විට රංගනයට ප්‍රවිෂ්ට වී සිටින්නීය. 1999 පෙබරවාරි 24 වැනි දින අජේ දේව්ගන් සමග විවාහ වූ කාජල් දැන් නිසා නම් හත් හැවිරිදි දියණියකගේ ආදරණීය මවකි.

පන්ච්ගනී ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලයෙන් ඉගෙනුම ලබමින් සිටිය දී, කාජල් රංගනයට පිවිසියාය. ඒ වන විට ඇයට වයස දහ හතක් පිරුණා පමණි. 1992 වසරේ දී තිරගත වූ "බෙකුඩි" ඇය රඟපෑ පළමු සිනමා පටයයි. එය ආදායම් වාර්තා පිහිට වූ චිත්‍රපටයක් නොවූවත්, ඇයගේ රංගන කුසලතාවය නම් පළමු රංගනයෙන් ම ප්‍රේක්ෂකයෝ හඳුනා ගත්හ.

**නීල දිගු දෑස ඇයගේ රංගන ප්‍රතිභාවේ කැඩපතයි. එක් තියුණු බැල්මකින් ඇය මොනතරම් දේ පවසනවාද? කාජල් නම් වර්තමාන භාරත සිනමාවේ ප්‍රබල චරිතාංග නිළියගේ එක් රංගනයක් හෝ නැරඹුවොත් ඇය, කිසි දිනක රසිකයකුගේ මතකයෙන් ගිලිහී නොයනු ඇත. එපමණටම ඇයගේ රංගනය ප්‍රබලය.**

කාජල් ගේ නවතම රංගනය රැගත් MY NAME IS KHAN ඔබ මේ වන විටත් නරඹා ඇති. ඉන්දියානු සිනමා වංශකතාවේ සිව්වැනි රංග පරම්පරාවකට උරුමකම් කීමට ලැබීම කාජල්ගේ මෙම සුවිශේෂී දක්ෂතාවයට එක් හේතුවක් විය හැකිය. මුලින්ම රංගන කලාවට පිවිස ඇත්තේ කාජල්ගේ මිත්තනිය වන සෝභනා සමරත් ගේ මවයි. ඇය තිහ, හතලිහ දශක වල නමක් තැබූ රතන් බායි නම් නිළියයි.

කාජල්ගේ මිත්තනිය හතලිහ , පනහ දශකවල භාරත සිනමාවේ දිදුලන තාරකාවකි. කාජල්ගේ මව තනූජා නම් ශ්‍රී ලාංකික රසිකයන්ට නුහුරු නුපුරුදු නිළියක නොවෙයි. හාති මෙරේ සාති වැනි ජනප්‍රිය සිනමා පටවල රඟ පෑ ඇය සිංහල සිනමා පටයකට ද රංගනයෙන් දායක වී තිබේ.

භාරත සිනමාවේ හොඳම නිළිය ලෙසින් පස් වරක් ෆිල්ම් ෆෙයාර් සම්මානයට පාත්‍ර වෙමින් වැඩිම වාර ගණනක් සම්මානයට පාත්‍ර වී සිටින නිළිය ලෙස වාර්තා තැබූ නූටාන් කාජල්ගේ ලොකු අම්මායි. කාජල් පනහ, හැට , හැත්තෑ දශක වල විදී තිරයේ අභිංසක පෙම්වතා වූ ජෝයි මුඛර්ජීගේ ඥාති දියණියකි. කාජල් ගේ පියා ශෝමු මුඛර්ජී චිත්‍රපට නිෂ්පාදකවරයෙකි. ඇයගේ පිය පරපුරේ වැඩි දෙනෙකු චිත්‍රපට නිෂ්පාදකවරුන්ය. ඇය විවාහ වී සිටින්නේ ද වත්මන් සිනමාවේ ක්‍රියාදාම සිනමා පටවලටද නැතිවම බැරි චරිතාංග නළුවකු ද වූ අජේ දේව්ගන් සමගයි.



Kajol